නාවික හා සාගරික විද්‍යාපීඨය
නාවික කදවුර
එන්එම්ජ්/සීඕ/එස්ඊසී/ඒඩීඑම්/බී/4/2022 ත්‍රිකුණාමලය

බෙදාහැරීම බලන්න 2022 මැයි 12

**<u>අණදෙන නිළධාරීගේ තාවකාලික සංදේශය අංක 12/2022</u>**
**<u>නාවික හා සාගරික විද්‍යාපීඨයේ පුහුණු නාවිකයින්ගේ නිවස පහසුකම් සඳහා තණ්ඩලේ ගබඩාවෙන් නිකුත් කරන ලද ස්ථිර ගබඩා විෂයයන් නිසියාකාරව භාරදීම, භාර ගැනීම, භාවිතා කිරීම නිවස්නයන් හා ඒ අවට පරිසරය නිසි පරිදි පවත්වාගෙන යාම සඳහා උපදෙස් හා නියෝග</u>**

1. නාවික හා සාගරික විද්‍යාපීඨයේ නාවිකයින්ගේ නිවස්නයන් සඳහා තණ්ඩලේ ගබඩාවෙන් නිකුත් කරන ලද ස්ථිර ගබඩා විෂයයන් නිසියාකාරව භාරදීම/භාර ගැනීම සහ භාවිතා කිරීම සහ නිවස්නයන් හා ඒ අවට පරිසරය නිසි පරිදි පවත්වාගෙන යාම සඳහා තණ්ඩලේ ගබඩාව භාර නාවික පුද්ගලයින් විසින් පහත දක්වා ඇති උපදෙස් හා නියෝග අනුව කටයුතු කල යුතුය.

අ. පුහුණු වන නාවිකයින්ගේ නිවාස සඳහා නිකුත් කරන ලද පහත සඳහන් ස්ථිර ගබඩා විෂයයන් එම පාසල භාර ප්‍රධාන උපදේශක විසින් භාර ගැනීම සහ භාර දීම නිසියාකාරව සිදු කිරීමටත්,එම විෂයයන් ආරක්‍ෂා කිරීමට, නඩත්තු කිරීම හා අළුත්වැඩියා කටයුතු සඳහා මාණ්ඩලික සටහන්පත් යොමු කර අවශ්‍යතාවයන් සිදුකර ගැනීමට වගබලා ගත යුතුය.

(1) විදුලි පංකා
(2) ගිනි නිවීමේ උපකරණ
(3) ඇඳන්
(4) ලොකර්
(5) මෙට්ට සහ කොට්ට
(6) ප්ලාස්ටික් පුටු
(7) කණ්නාඩි

ආ. පරිපාලන නිවාසය සඳහා භාර ගන්නා ලද ස්ථිර ගබඩා විෂයයන් එම නිවාසය භාර ජ්‍යෙෂ්ඨතම නාවිකයා විසින් භාර ගැනීම සහ භාර දීම නිසියාකාරව සිදු කිරීමටත්,එම විෂයයන් ආරක්‍ෂා කිරීම, නඩත්තු කිරීම හා අළුත්වැඩියා කටයුතු සඳහා මාණ්ඩලික සටහන්පත් යොමු කර අවශ්‍යතාවයන් සිදුකර ගැනීමට වගබලා ගත යුතුය.

ඇ. සනීපාරක්‍ෂක ද්‍රව්‍ය නාවික ගබඩාවේ නොමැති බැවින් ඒ සම්බන්ධයෙන් අංශභාර කණ්ඩායම් විසින් අවධානය යොමු කර නිවාසයන්හි නාන කාමර සහ වැසිකිලි වල පිරිසිදු තාවය නිසි පරිදි පවත්වාගෙන යාමට සියළු පාසල් වල ප්‍රධාන උපදේශකයන් ඇතුළු ජ්‍යෙෂ්ඨ හා කනිෂ්ඨ උපදේශකයින් වගබලා ගත යුතුය.

ඈ. සියළු පාසල් වලට අයිති ගොඩනැගිලි හා නිවාස අවට ප්‍රදේශය පිරිසිදුව හා ක්‍රමවත්ව පවත්වාගෙන යාමට ප්‍රධාන උපදේශක ඇතුළු ජ්‍යෙෂ්ඨ හා කණිෂ්ඨ උපදේශකයින් වගබලා ගත යුතුය.

ඉ. සියළු පාසල් වලට අදාල පාඨමාලා අවසානයේ නව පාඨමාලාවක් සඳහා නාවිකයින් පැමිණෙන තුරු එම නිවාසයට හා ගොඩනැගිල්ලට අදාල නිත්‍ය ණය ලේඛණයට ඇතුලත් සියළු භාණ්ඩ ආරක්ෂාකාරීව තබා ගැනීම නඩත්තු කර පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් ප්‍රධාන උපදේශක ඇතුළු ජොෂ්ඨ හා කණිෂ්ඨ උපදේශකයින් වගබලා ගත යුතුය.

ඊ. පාසල් භාර නිලධාරීන් විසින් විසින් මාසිකව අහඹු චරිකාචාරයක් සිදුකර එම ගොඩනැගිලිවල අඩු ලුහුඩුකම් හා භාණ්ඩ ප්‍රමාණයන් නිසි ලෙස පවත්වාගෙන යාමට අවශ්‍ය උපදෙස් ලබා දීමට කටයුතු කළ යුතුය.

උ. නිවස්නයේ හා ගොඩනැගිල්ලේ ඇති නිත්‍ය ණය ලේඛණය භාර ජොෂ්ඨතම නාවිකයා වෙනත් ආයතනයක් වෙත මාරුවී යාමට ප්‍රථම තණ්ඩලේ ගබඩාවට සමඟ සම්බන්ධීකරණය වී නිත්‍ය ණය ලේඛණයේහි ඇති භාණ්ඩ නිසි පරිදි යාවත්කාලීන කර භාර දීමට අවශ්‍ය කටයුතු සිදුකළ යුතුය.

ඌ. පාසල භාර ප්‍රධාන උපදේශකයින් සහ පරිපාලන නිවාසය භාර ජොෂ්ඨතම නාවිකයා ගොඩනැගිල්ල/නිවස්නය වෙත තණ්ඩලේ ගබඩාවෙන් ලබා ගන්නා ලද භාණ්ඩ පිලිබඳව වාර්ෂික දෙපාර්තමේන්තු සමීක්ෂණයේදී නිත්‍ය ණය ලේඛණය සමඟ සංසන්දනය කර එහි ඇති භාණ්ඩ සම්බන්ධයෙන් වාර්ථාවක් අංශභාර නිලධාරි මගින් සහතික කර තණ්ඩලේ ගබඩාවට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.

2. නාවික හා සාගරික විද්‍යාපීඨයට අනුයුක්ත නාවිකයින් හට නිවාස පහසුකම් සඳහා පහත සඳහන් පරිදි ගොඩනැගිලි වෙන් කර ඇති අතර,පාසල් භාර ජොෂ්ඨ උපදේශකයින් විසින් නිසි පරිදි එම ගොඩනැගිලි පවත්වා ගෙන යාමට කටයුතු කළ යුතුය.

| | | | |
|---|---|---|---|
| අ. | A ගොඩනැගිල්ල | - | වෛද්‍ය පාසල, ජලතරණ පාසල, දියයට සංග්‍රාමික පාසල |
| ආ. | B ගොඩනැගිල්ල | - | විදුලි පාසල, සංඥා පාසල |
| ඇ. | E නව ගොඩනැගිල්ල | - | ඉංජිනේරු පාසල,විනයාරක්‍ෂක පාසල,නාවික ශිල්ප පාසල, තොරතුරු තාක්‍ෂණ පාසල, සිවිල් ඉංජිනේරු පාසල, ක්‍රීඩා පාසල ජලශාස්ත්‍රීය පාසල |
| ඈ. | E පැරණි ගොඩනැගිල්ල | - | පරිපාලන අංශයේ සහ ප්‍රවාහන සහයක අංශයේ නාවිකයන් සඳහා |
| ඉ. | F ගොඩනැගිල්ල | - | අවි පාසල |
| ඊ | I ගොඩනැගිල්ල (පුහුණුවන ජොෂ්ඨ නාවිකයින්) | - | වෙළඳ නාවික පුහුණු පාසල ජලතරණ පාසල, ගිනි නිවීම හා ආපදා මර්ධන පාසල,IPC පාඨමාලාව, C/W පාඨමාලාව |
| උ. | J ගොඩනැගිල්ල | - | සැපයුම් පාසල |
| ඌ. | K ගොඩනැගිල්ල | - | සියළුම උපදේශක කණිෂ්ඨ නාවිකයින් සඳහා |
| එ. | කාන්තා නාවික නිවාසය | - | නාසාවි අයත් සියළුම කාන්තා නාවිකයින් |
| ඒ. | ටින් හට් (නිලධාරි පුහුණු කිරීමේ සංචිතය අසල) | - | ගිනි නිවීම හා ආපදා මර්ධන පාසල |
| ඔ. | කිමිදුම් පාසල් ගොඩනැගිල්ල | | කිමිදුම් පාසල |
| ඕ. | සටන් පුහුණු ඒකක ගොඩනැගිල්ල | | - සටන් පුහුණු පාසල |
| ක. | ප්‍රගුණ වෙඩික්කරු ගොඩනැගිල්ල | | - ප්‍රගුණ වෙඩික්කරු පාසල |
| ඛ. | නිලධාරි පුහුනු නිවාසය(C) | | - ජලතරණ පාසල(RP II) |

3. ඉහත සදහන් උපදෙස් හා නියෝග ප්‍රකාරව කටයුතු කිරීමට සියළුම නාවික පුද්ගලයින් විසින් කටයුතු කල යුතු අතර, ඊට පටහැනිව කටයුතු කරනු ලබන නාවික පුද්ගලයින් හට විනයානුකූලව කටයුතු කරන බැ්වි දැන්වේ.

එස්සී අන්නතුගොඩ,ආර්එස්පි**
කපිතාන්(අවි)
අණදෙන නිලධාරි

බෙදාහැරිම**:-** සම්පූර්ණ (අභ්‍යන්තර)